# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/31 - 2017 ජනවාරි මස 31 වැනි අඟහරුවාදා - 2017.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වැනි වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දාහතක් වූ ජනවාරි මස 31 වැනි දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

රවි කරුණානායක,<br>
මුදල් අමාත්‍ය.

2017 ජනවාරි මස 31 වැනි දින,<br>
කොළඹ දී ය.

*උපලේඛනය*

01. සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරලේ, මැද්දේ මැදිලිය පත්තුවේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බතඹුරේ ග්‍රාමසේවා වසම (අංක 10 ඒ) තුළ බතඹුරේ පිහිටි උඩුගමගේ වත්ත නමැති ඉඩමට ඩී. රත්නායක බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද 1993.07.29 වැනි දින සහ අංක 1587 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 03 දරන පර්චස් තිස්තුන (අ. 0 රූ. 0 ප. 33) ක් විශාල ඉඩමට ඉහත කී අංක 1587 දරන පිඹුරේ සඳහන් ප්‍රකාර මායිම්.

    උතුරට අංක 02 දරන කැබැල්ල ද, නැගෙනහිරට පනුඅඹගහමුල වත්ත සහ පැලඉනි වැට ද, දකුණට අංක 04 දරන කැබැල්ල ද, බස්නාහිරට ඩී. ඇම්. කරුණාරත්න සහ තවත් අය හිමිකම් කියන දිවුන්ගලේ වත්ත ද, අංක 02 දරන කැබැල්ල ද මෙහි තුළ ඉඩම සහ ඊට අයිති ගසකොළ පළතුරු ආදී සියලුදේත් වේ.

    මෙම දේපල කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 399/48 යටතේ ලියාපදිංචි වී ඇත.

02. උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි දකුණ (කරවෙඩ්ඩි) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක J/359 දරන ඉමායනන් ග්‍රාම නිලධාරී වසමේ උඩුප්පිඩි ග්‍රාමයේ පිහිටි "චෙම්පාඩු" නැමැති වරගු වගා ලාවම් තුනයි කුලී හතරයි කාලක් විශාල ඉඩමට මායිම්, උතුරින් සිවචෙල්වම් සහ ඔහුගේ බිරිඳගේ ඉඩම ද, නැගෙනහිරින් චින්නාර් තම්බිමුත්තුගේ උරුමකරුවන්ට අයත් දේපළ ද, දකුණින් ටී. ෂන්මුගම්ගේ දේපළින් ද, බස්නාහිරින් පාර ද, මායිම් වූ ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, ගසකොළ, ලිඳ ආදී සියළු දේ ත් වේ.

    මෙම ඉඩම යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 310/75 වන යටතේ ලියාපදිංචි වී ඇත.

02 - 630

1A - PG 3380 — 107 (2017/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*